කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2694846
: 011 2694847 Ext -804/805
Fax : 011 2698311
E-mail : agromet12@yahoo.com
Web : www.meteo.gov.lk
: https://www.facebook.com/SLMetDept/

Agro meteorological Bulletin - කෘෂි කාලගුණ තොරතුරු ප්‍රකාශය

Vol: 44-2021 **44 වන සතිය** **44th Week**

ඔක්තෝබර් 22 සිට ඔක්තෝබර් 28 දක්වා සතිය තුල පැවති කාලගුණ තත්වයේ සාරාංශය:



රූපය 01
ඔක්තෝබර් 22 සිට ඔක්තෝබර් 28 දක්වා සතිය තුල වාර්තාවූ මුළු වර්ෂාපතනය(මි.මී)

- පැය 24 ක් තුල වාර්තා වූ වැඩිම වර්ෂාපතනය වන මි.මී 146.5 හංවැල්ල ප්‍රදේශයෙන් ඔක්තෝබර් 27 වන දින වාර්තා විය.

- උපරිම උෂ්ණත්වයේ සාමාන්‍යය අගයයට වඩා වැඩිවීමේ වැඩිම අගය සෙල්සියස් අංශක 2.4 ක් වූ අතර, එය ඔක්තෝබර් 22 වන දින සෙල්සියස් අංශක 31.0 ක් ලෙස කටුගස්තොට ප්‍රදේශයෙන් වාර්තා විය.

- අවම උෂ්ණත්වයේ සාමාන්‍යය අගයයට වඩා අඩු වීමේ පහලම අගය සෙල්සියස් අංශක 1.4 ක් වූ අතර, එය ඔක්තෝබර් 28 වන දා සෙල්සියස් අංශක 23.8 ක් ලෙස මන්නාරම ප්‍රදේශයෙන් වාර්තා විය.

ඇතුලත:

පසුගිය සතිය තුල පැවති කාලගුණ තත්වය

වර්ෂාපතනය
දෛනික වර්ෂාපතනයන් පි. 02
වැඩිම වර්ෂාපතන අගයයන් පි. 02
වර්ෂාපතනයේ වෙනස්වීම පි. 03
වර්ෂාපතනයේ වෙනස්වීමේ ප්‍රතිශතය පි. 03
සමුච්චිත වර්ෂාපතනයේ හැසිරීම පි. 04
උෂ්ණත්වය
උපරිම උෂ්ණත්වයේ වැඩිවීම පි. 07
උපරිම උෂ්ණත්වයේ අඩුවීම පි. 07
අවම උෂ්ණත්වයේ වැඩිවීම පි. 08
අවම උෂ්ණත්වයේ අඩුවීම පි. 08
පසුගිය සතිය තුල උපරිම/අවම පි. 09
උපරිම/අවම උෂ්ණත්ව සාමාන්‍යයන් පි. 09

ඉදිරි සතිය සඳහා කාලගුණ තත්වය

පාංශු ජලය පි. 10

පාංශු උෂ්ණත්වය පි. 11

කෘෂි කාලගුණ පරාමිතීන් හි සති සාමාන්‍යයන් පි. 12

ඉදිරි සතිය සඳහා කාලගුණ අනාවැකිය පි. 14

ඉදිරි දින 20 සඳහා පස් දින කාලය තුල ලැබිය හැකි වර්ෂාපතන අගයයන්හි වෙනස්වීම පි. 15

කෘෂි කාලගුණ අංශය
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
383, බෞද්ධාලෝක මාවත
කොළඹ 07

Agromet Division
Department of Meteorology
383, Baudhaloka Mawatha
Colombo 07

පසුගිය සතිය තුළ පැවති කාලගුණය

1. වර්ෂාපතනය



රූපය 01



රූපය 02



රූපය 03



රූපය 04



රූපය 05



රූපය 06



රූපය 07

දිනය	වර්ෂාපතනය (මි.මී)	ප්‍රදේශය
2021-10-22	105.2	මඩාටුගම (අනුරාධපුරය)
2021-10-23	110.0	බත්තරමුල්ල (AWS)
2021-10-24	120.0	රූගම් (මඩකලපුව)
2021-10-25	140.6	වේවැල්තලාව (කෑගල්ල)
2021-10-26	106.5	නෝටන් (නුවරඑළිය)
2021-10-27	146.5	හංවැල්ල (AWS)
2021-10-28	83.9	මන්නාරම

වගුව 1. දිනක් තුළ පැවති ඉහළම වර්ෂාපතනය.

2. වර්ෂාපතනයේ වෙනස්වීම (Anomaly)



01 වන රූපය. 2021 ජනවාරි 01 සිට 2021 ඔක්තෝබර් 28 දක්වා වර්ෂාපතනය, සාමාන්‍යය (1981-2010) වර්ෂාපතන අගයයන්ට වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස



02 වන රූපය. 43 වන සතිය තුළ ලැබුණු වර්ෂාපතනය එම සතිය තුල සාමාන්‍යය (1981-2010) වර්ෂාපතන අගයයන්ට වඩා වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස

3. වර්ෂාපතනයේ වෙනස්වීමේ ප්‍රතිශතය

දිස්ත්‍රික්කය	වර්ෂාපතනය වැඩිවීම ප්‍රතිශතයක් ලෙස	වර්ෂාපතනය අඩුවීම ප්‍රතිශතයක් ලෙස
යාපනය	59.8%	-
මන්නාරම	96.9%	-
වවුනියාව	43.1%	-
අනුරාධපුරය	16.8%	-
ත්‍රිකුණාමලය	24.8%	-
පුත්තලම	45.7%	-
පොළොන්නරුව	49.8%	-
කුරුණෑගල	29.9%	-
මාතලේ	18.9%	-
මඩකලපුව	68.9%	-
අම්පාර	81.6%	-
මහනුවර	32.5%	-
කෑගල්ල	44.9%	-
නුවරඑළිය	23.0%	-
බදුල්ල	18.9%	-
ගම්පහ	20.2%	-
කොළඹ	26.9%	-
කළුතර	8.6%	-
ගාල්ල	38.1%	-
මාතර	28.1%	-
රත්නපුර	18.8%	-
හම්බන්තොට	21.0%	-
මොණරාගල	38.4%	-

වගුව 01. 2021 ජනවාරි 1 සිට ඔක්තෝබර් 28 දක්වා වාර්තා වූ මුළු වර්ෂාපතනය, සාමාන්‍යය වර්ෂාපතනය (1981-2010 සාමාන්‍යය) සමග වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස (2 රූපය)

දිස්ත්‍රික්කය	වර්ෂාපතනය වැඩිවීම ප්‍රතිශතයක් ලෙස	වර්ෂාපතනය අඩුවීම ප්‍රතිශතයක් ලෙස
යාපනය		24.8%
මන්නාරම	123.4%	
වවුනියාව	120.6%	
අනුරාධපුරය	13.3%	
ත්‍රිකුණාමලය	16.5%	
පුත්තලම		7.4%
පොළොන්නරුව	27.1%	
කුරුණෑගල		26.3%
මාතලේ	45.0%	
මඩකලපුව		38.9%
අම්පාර	7.3%	
මහනුවර		21.1%
කෑගල්ල	33.4%	
නුවරඑළිය	70.8%	
බදුල්ල	22.4%	
ගම්පහ		10.0%
කොළඹ	3.5%	
කළුතර		69.1%
ගාල්ල		61.7%
මාතර		4.4%
රත්නපුර	4.4%	
හම්බන්තොට	33.0%	
මොණරාගල	236.8%	

වගුව 02. 43 වන සතිය තුල (ඔක්තෝබර් 22 සිට ඔක්තෝබර් 28 දක්වා) වර්ෂාපතනය සති සාමාන්‍යය වර්ෂාපතනය (1981-2010 සාමාන්‍යය) සමග වෙනස්වීම ප්‍රතිශතයක් ලෙස (3 රූපය)

4. එක් එක් දිස්ත්‍රික්කයේ 2021 ජනවාරි 1 සිට ඔක්තෝබර් 28 දක්වා සමුච්චිත වර්ෂාපතනය සහ සාමාන්‍යය සමුච්චිත වර්ෂාපතනය (1981-2010) හැසිරීම.
















Ratnapura
RAINFALL (MM)
4000.0
3000.0
2000.0
1000.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Kandy
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Matale
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Nuwara Eliya
RAINFALL (MM)
3000.0
2000.0
1000.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Badulla
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Monaragala
RAINFALL (MM)
2500.0
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Ampara
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Batticaloa
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Trincomalee
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Anuradhapura
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Polonnaruwa
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Vavuniya
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Jaffna
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Mannar
RAINFALL (MM)
1000.0
800.0
600.0
400.0
200.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Puttalam
RAINFALL (MM)
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall


Kurunegala
RAINFALL (MM)
2000.0
1500.0
1000.0
500.0
0.0
1 4 7 10131619222528313437404346 4952
WEEK NUMBER
2020
2021
1981-2010 Average rainfall

4. 43 වන සතිය තුල (ඔක්තෝබර් 22 සිට ඔක්තෝබර් 28 දක්වා) උපරිම උෂ්ණත්වයේ හැසිරීම

43 වන සතිය තුල උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන් (1961-1990) සමග වාර්තා වූ වෙනස පහත පරිදි වේ.

4.1 උපරිම උෂ්ණත්වයේ වැඩිවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය වෙනස්වූ ඒකක ගණන (^0C)	සතිය තුල එම තත්වය පැවති දින ගණන
නුවරඑළිය	1 – 2	05
හම්බන්තොට, රත්මලාන	1 – 2	04
කටුගස්තොට	1 – 2	03
අනුරාධපුරය, බණ්ඩාරවෙල, ගාල්ල කුරුණෑගල, ත්‍රිකුණාමලය	1 – 2	02
කොළඹ, යාපනය, කටුනායක, මහඉලුප්පල්ලම, මන්නාරම, රත්නපුරය වව්නියාව	1 – 2	01

වගුව 01. සතියේ උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා වැඩිවූ අංශක ගණන සහ සතිය තුල එම වැඩිවීම පැවති දින ගණන

සතියේ උපරිම උෂ්ණත්ව අගයයන්, ඒවායේ සාමාන්‍යය අගයයන් (1961- 1990) සමග සැසඳීමේදී උපරිම උෂ්ණත්වයේ වැඩිවීම, වගු අංක 01 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 1 - 2ත් අතර අගයයක් ගනී, එම වැඩිවීම නුවරඑළිය කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේදී දින 5කදී වාර්තාවී ඇත. එලෙසම එම අගයයන්ගේම අඩුවීම ද වගු අංක 02හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 1 - 2ත් අතර අගයයක් ගනී

4.2 උපරිම උෂ්ණත්වයේ අඩුවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය අඩුවූ අංශක ගණන (^0C)	සතිය තුල එම අඩුවීම පැවති දින ගණන
ත්‍රිකුණාමලය	1 – 2	04
බදුල්ල	1 – 2	03
යාපනය, මහඉලුප්පල්ලම, පුත්තලම	1 – 2	02
අනුරාධපුරය, බණ්ඩාරවෙල, යාපනය රත්මලාන, වව්නියාව	1 – 2	01

වගුව 02. ප්‍රධාන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල සතියේ උපරිම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය උපරිම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා අඩුවූ අංශක ගණන සහ සතිය තුල එම අඩුවීම පැවති දින ගණන.

5. 43 වන සතිය තුල (ඔක්තෝබර් 22 සිට ඔක්තෝබර් 28 දක්වා) අවම උෂ්ණත්වයේ හැසිරීම.

43 වන සතිය තුල අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන් (1961-1990) සමග ඇති වෙනස පහත පරිදි වේ.

5.1 අවම උෂ්ණත්වයේ වැඩිවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය වැඩිවූ අංශක ගණන (^0C)	සතිය තුල එම වැඩිවීම පැවති දින ගණන
කටුගස්තොට	1 – 2	06
බණ්ඩාරවෙල	1 – 2	05
බදුල්ල, නුවරඑළිය, වව්නියාව	1 – 2	04
අනුරාධපුරය, ගාල්ල, හම්බන්තොට කුරුණෑගල, මන්නාරම	1 – 2	03
මඩකලපුව, මහඉලුප්පල්ලම, පුත්තලම	1 – 2	02
කොළඹ, යාපනය, කටුනායක, රත්මලාන	1 – 2	01

වගුව 01. ප්‍රධාන කාලගුණ විද්‍යා මධ්‍යස්ථානවල අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා වැඩිවූ ඒකක ගණන සහ සතිය තුල එම වැඩි වීම පැවති දින ගණන

සතියේ අවම උෂ්ණත්ව අගයයන්, ඒවායේ සාමාන්‍යය අගයයන් (1961-1990) සමග සැසඳීමේදී,අවම උෂ්ණත්වයේ වැඩිවීම, වගු අංක 01 හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 1 - 2ත් අතර අගයයක් ගනී, එම වැඩිවීම කටුගස්තොට සහ බණ්ඩාරවෙල යන කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී පිලිවෙලින් දින 6කදී සහ දින 5කදී වාර්තාවී ඇත. එලෙසම එම අගයයන්ගේම අඩුවීම වගු අංක 02හි සඳහන් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලදී සෙන්ටිග්‍රේඩ් අංශක 1ක පමණ අගයයක් ගනී

5.2 අවම උෂ්ණත්වයේ අඩුවීම

කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන	උෂ්ණත්වය අඩුවූ අංශක ගණන (^0C)	සතිය තුල එම අඩුවීම පැවති දින ගණන
ත්‍රිකුණාමලය	1ක් පමණ	02
බදුල්ල, හම්බන්තොට, යාපනය මන්නාරම, රත්නපුරය	1ක් පමණ	01

වගුව 02. අවම උෂ්ණත්ව අගයයන් එම කාලය තුල සාමාන්‍යය අවම උෂ්ණත්ව අගයයන්ට (1961-1990) වඩා අඩුවූ අංශක ගණන සහ සතිය තුල එම අඩුවීම පැවති දින ගණන

6. 43 වන සතිය තුල උපරිම සහ අවම උෂ්ණත්වයන්හි ඉහළම වැඩිවීම් හා පහළම අඩුවීම්

		දිනය	ප්‍රදේශය	අංශක ගණන (^{0}C)	වාර්තා වූ උෂ්ණත්වය (^{0}C)
උපරිම උෂ්ණත්වය	ඉහළම වැඩිවීම	2021-10-22	කටුගස්තොට	2.4	31.0
	පහළම අඩුවීම	2021-10-28	බදුල්ල	2.3	26.6
අවම උෂ්ණත්වය	ඉහළම වැඩිවීම	2021-10-28	බණ්ඩාරවෙල නුවරඑළිය	2.4	18.2 14.2
	පහළම අඩුවීම	2021-10-28	මන්නාරම	1.4	23.8

7. 43 වන සතියේ සාමාන්‍යය උපරිම උෂ්ණත්වය හා අවම උෂ්ණත්වයන් එහි සති සාමාන්‍යය (1961-1990,30 Year Average) සමග ඇති වෙනස



රූපය 01



රූපය 02

01 වන රූපය මගින් උපරිම උෂ්ණත්වය වෙනස් වීම හා **02** වන රූපය මගින් අවම උෂ්ණත්වය වෙනස් වීම එහි සති සාමාන්‍යය **(1961-1990,30 Year Average)** සමග ඇති වෙනස පෙන්නුම් කරයි.

8.1 ඉදිරි සතිය තුල එක් එක් මට්ටම්වල පාංශු ජල ප්‍රමාණයයන් පිළිබඳ අනාවැකිය.

පොළොව තුල එක් එක් මට්ටම් වල පැවතිය හැකි පාංශු ජල ප්‍රමාණයන් ප්‍රතිශතයක් ලෙස පහත රූප සටහන් වලින් දක්වා ඇත. (ECMWF දත්ත යොදා ගෙන ගණිතමය ආකෘති මගින් ගණනය කරන ලදි)



රූපය 01 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 ක් දක්වා වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 02 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 .ත් සෙ.මී. 28 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 03 පොළොව මට්ටමේ සිට සෙ.මී. 28 ත් සෙ.මී. 100 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.



රූපය 04 පොළොව මට්ටමේ සිට සෙ.මී. 100 ත් සෙ.මී. 289 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු ජල ප්‍රමාණය.

ඉදිරි සතිය තුලදී පාංශු ජල මට්ටම දිවයිනේ තෙත් කලාපය ආශ්‍රිතව 40% - 50% ක පමණ ඉහල අගයයක් ගනී. අතරමැද කලාපයේදීත්, සෙ.මී. 0-28 මට්ටමේ වියලි කලාපයේදීත් 30% - 40 % ක පමණ සාමාන්‍ය අගයයක් ගනී. සෙ.මී. 28 -289 මට්ටමේදී වියලි කලාපය ආශ්‍රිතව 10% -20% අතර පහල අගයයක් ගනී.සෙ.මී 28-100 මට්ටමේදී යාපනය,මොණරාගල සහ හම්බන්තොට යන දිස්ත්‍රික්ක දිස්ත්‍රික්ක වලදී 10% ට වඩා ඉතා අඩු අගයක් ගන්නා බව දැකගත හැක.

8.2 ඉදිරි සතිය තුල එක් එක් මට්ටම්වල පාංශු උෂ්ණත්වය පිළිබඳ අනාවැකිය.

පොළොව තුල එක් එක් මට්ටම් වල පැවතිය හැකි පාංශු උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක වලින් දක්වා ඇත. (ECMWF දත්ත යොදා ගෙන ගණිතමය ආකෘති මගින් ගණනය කරන ලදි)



රූපය 05 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 ක් දක්වා වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය.



රූපය 06 පොළොව මට්ටමේ සිට සෙ.මී. 7 .ත් සෙ.මී. 28 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය.



රූපය 07 පොළොව මට්ටමේ සිට සෙ.මී. 28 ත් සෙ.මී. 100 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය



රූපය 08 පොළොව මට්ටමේ සිට සෙ.මී. 100 ත් සෙ.මී. 289 ත් අතර වන ස්ථරයේ පවතින පාංශු උෂ්ණත්වය.

ඉදිරි සතිය තුලදී පාංශු උෂ්ණත්වය ගණනය කරන ලද මට්ටම් 4හි දීම (රූපය 05, 06, 07 සහ 08) නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක තුලදී සෙල්සියස් අංශක 10 -18 ක පමණ පහල අගයයකුත්, සෙ.මී. 0 ත් සෙ.මී. 28 ත් අතරමට්ටමේදී තෙත් කලාපය,වයඹ පලාත සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක වලදීත්, සෙ.මී. 28 ත් සෙ.මී. 289 ත් අතර මට්ටමේදී දකුණු සහ සබරගමුව පලාත් ආශ්‍රිතවත්, සෙල්සියස් 25 පමණ සාමාන්‍ය අගයයකුත්, සෙසු ප්‍රදේශ වලදී සෙල්සියස් 26 -32ක පමණ ඉහල අගයයක්ද ගනී.

9. ඉදිරි සතිය සඳහා කෘෂි කාලගුණ තත්ත්වය පිළිබඳ සති සාමාන්‍යයන්,

2000-2018 වසර වල වාර්තා වූ දත්ත වලට අනුව පහත සාමාන්‍යය අගයන් ගණනය කර ඇත.



වාශ්පීභවනය - මිමී/දින (Evaporation) mm/day



වර්ෂාපතනය - මිමී (Rainfall) mm



සාපේක්ෂ ආර්ද්‍රතාව 0830h- (Relative Humidity) %



සාපේක්ෂ ආර්ද්‍රතාව 1530h- (Relative Humidity)%



උපරිම උෂ්ණත්වය - සෙල්සියස් අංශක
(Maximum Temperature) - C^0



අවම උෂ්ණත්වය - සෙල්සියස් අංශක
(Minimum Temperature) - C^0



සූර්ය දීප්ත පැය ගණන
(Sunshine Hours)

10. ඉදිරි දින 7 සඳහා කාලගුණ අනාවැකිය,

10.1 2021 ඔක්තෝබර් 30 දින සිට නොවැම්බර් 05 දින දක්වා දෛනික වර්ෂාපතන අනාවැකිය.

(ECMWF 2021-10-29 වන දින දත්ත යොදා ගෙන ගණිතමය ආකෘති මගින් ගණනය කරන ලදි)



2021-10-30



2021-10-31



2021-11-01



2021-11-02



2021-11-03



2021-11-04



2021-11-05

ඉදිරි සතියේ දී දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ ඉතා වැඩි හැකියාවක් පවතින අතර, මෙම වැසි තත්වය මෙම කාලයේ සාමාන්‍යය අගයට වඩා වැඩි වීමක් අපේක්ෂා කරයි. මෙම තත්වය දිවයිනේ නිරිතදිග උතුරු හා වයඹදිග ප්‍රදේශ වලදී වැඩි අගයක් ගනු ඇත.

මෙහිදී ඔක්තෝම්බර් 30 දින දිවයිනේ බොහෝ ප්‍රදේශ වල වැසි හෝ ගිගුරුම් සහිත වැසි අපේක්ෂා කරන අතර, උතුරු, නැගෙනහිර හා නිරිතදිග ප්‍රදේශවල තද වැසි ඇතිවීමක් බලාපොරොත්තු වේ.

ඔක්තෝම්බර් 31 - නොවැම්බර් 02 කාලය තුල දිවයිනේ බොහෝ ප්‍රදේශවල තැනින් තැන වැසි ඇතිවීමක් අපේක්ෂා කරන අතර, ඇතැම් ස්ථානයක තරමක තද වැසි ඇතිවීමක් ද ඇතිවිය හැක.
නොවැම්බර් 03 දින වැසි තත්වයේ යම්කිසි අඩුවීමක් බලාපොරොත්තු වන අතර නොවැම්බර් 04-05 දිනවල නැවතත් දිවයිනේ තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවීමක් අපේක්ෂා කරයි. මෙහිදී දිවයිනේ නිරිතදිග හා උඟව පළාත් තුල වැසි ඇතිවීමේ හැකියාව ඉහල අගයක් ගන්නා අතර, ඇතැම් ස්ථානයක තරමක තද වැසි ඇතිවීමක් ද අපේක්ෂා කරයි.

10.2 ඉදිරි සතිය තුල ලැබිය හැකි වර්ෂාපතනය පිළිබඳ අනාවැකිය.



රූපය 08 සතිය තුල ලැබෙන වර්ෂාපතනය



රූපය 09. සාමාන්‍යයයන් (1961-1990) සමඟ වෙනස් වීම (Rainfall Anomaly)

උපුටා ගැනීම: INDIAN INSTITUTE OF TROPICAL METEOROLOGY, PUNE, INDIA

1 සතිය: (ඔක්තෝම්බර් 29 - නොවැම්බර් 04)

දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ ඉහල හැකියාවක් පවතී. එම වැසි තත්වය මෙම කාලයේ සාමාන්‍යය අගයට වඩා වැඩි වීමක් අපේක්ෂා කරන අතර, මෙම තත්වය දිවයිනේ නිරිතදිග, උතුරු හා වයඹදිග ප්‍රදේශ වලදී වැඩි අගයක් ගනු ඇත.

2 සතිය: (නොවැම්බර් 05 - 11)

දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ වැඩි හැකියාවක් පවතී. එසේම මෙම වැසි තත්වය දිවයිනේ නිරිතදිග හා වයඹදිග ප්‍රදේශ වලින් වැඩි වශයෙන් අපේක්ෂා කරයි. දිවයිනේ බොහෝ ප්‍රදේශ වලින් මෙම කාලයේ සාමාන්‍යයට වඩා වැඩි වර්ෂාපතනයක් අපේක්ෂා කරන අතර, මෙම අගය දිවයිනේ නිරිතදිග හා වයඹදිග ප්‍රදේශ වලදී වැඩි අගයක් ගනු ඇත.

3 සතිය: (නොවැම්බර් 12 - 18)

දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ සාමාන්‍යය හැකියාවක් පවතී. එසේම මෙම වැසි තත්වය දිවයිනේ බස්නාහිර හා වයඹ ප්‍රදේශ වලින් වැඩි වශයෙන් අපේක්ෂා කරයි. වයඹ ප්‍රදේශයේ ඇතිවන වැසි තත්වය මෙම කාලයේ සාමාන්‍යය වැසි තත්වයට වඩා සුළු වැඩිවීමක් අපේක්ෂා කරන අතර දිවයිනේ නැගෙනහිර ප්‍රදේශයේ දී සාමාන්‍යය අගයට වඩා අඩුවීමක් අපේක්ෂා කරයි.

4 සතිය: (නොවැම්බර් 19 - 25)

දිවයින ආශ්‍රිතව වැසි ඇතිවීමේ සාමාන්‍යය හැකියාවක් පවතී. එසේම මෙම වැසි තත්වය දිවයිනේ නිරතදිග හා මධ්‍යම කඳුකර ප්‍රදේශ වලින් වැඩි වශයෙන් අපේක්ෂා කරයි. කෙසේ වෙතත් දිවයිනේ බොහෝ ප්‍රදේශ වලින් මෙම කාලයේ සාමාන්‍යය අගයට වඩා අඩුවීමක් අපේක්ෂා කරයි.